# මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය

# ජාතික රක්ෂණ භාර අරමුදල

## රැකියා පුරප්පාඩුව

මුදල්, ක්‍රමසම්පාදන හා ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය යටතේ ස්ථාපිත කර ඇති ජාතික රක්ෂණභාර අරමුදල, අග්‍රහාර වෛද්‍ය රක්ෂණ, මෝටර් රථ රක්ෂණය වැනි රක්ෂණ යෝජනා ක්‍රම ක්‍රියාත්මක කරන අතර, දේශීය රක්ෂණකරුවන්ගේ ප්‍රතිරක්ෂකයා වශයෙන් කටයුතු කරන ශ්‍රී ලංකාව තුළ ස්ථාපිත කර ඇති එකම ආයතනය වේ. මෙම අරමුදල් මණ්ඩලය වසර 18ක් වැනි කෙටි කාලයක් තුළදී නව්‍යකරණය, වර්ධනය හා ලාභදායීත්වය සැලකීමේදී දේශීය රක්ෂණ කර්මාන්තයේ ප්‍රමුඛ ස්ථානයක් හිමිකර ගෙන ඇති රාජ්‍ය ආයතනයකි.

ජාතික රක්ෂණ භාර අරමුදල් මණ්ඩලයේ පහත සඳහන් පුරප්පාඩුව සඳහා සුදුසුකම්ලත් පුද්ගලයන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**01. අවදානම් කළමනාකරු (HM 1-2)**

බාහිර අයදුම්කරුවන් (1 හෝ 2)

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන විශ්වවිද්‍යාලයකින් රක්ෂණය/ ගිණුම්කරණය/ ව්‍යාපාර පරිපාලන/ මූල්‍ය/ වාණිජ්‍යය හෝ අදාළ විෂය ක්ෂේත්‍රයේ වෙනත් උපාධියක් ලබා තිබීම.

   **සමග**

   අදාළ ක්ෂේත්‍රය පිළිබඳ පශ්චාත් උපාධියක් ලබා තිබීම

   **හෝ**

   අදාළ ක්ෂේත්‍රයේ පිළිගත් වෘත්තීය වරලත් ආයතනයක, ආයතනික සාමාජිකත්වය ලබා තිබීම.(Associate Membership)

   **සහ**

   සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක/ ආයතනයක හෝ පිළිගත් පුද්ගලික ආයතනයක කළමනාකරණ මට්ටමේ අවම වශයෙන් වසර 13 ක සේවා පළපුරුද්ද

2. අදාළ ක්ෂේත්‍රයේ පිළිගත් වෘත්තීය වරලත් ආයතනයක පූර්ණ සාමාජිකත්වය ලබා තිබීම. (Full Membership)

   **සහ**

   සංස්ථාවක, ව්‍යාවස්ථාපිත මණ්ඩලයක/ ආයතනයක හෝ පිළිගත් පුද්ගලික ආයතනයක කළමනාකරණ මට්ටමේ අවම වශයෙන් වසර 13 ක සේවා පළපුරුද්ද

අභ්‍යන්තර අයදුම්කරුවන් (1 හෝ 2)

1. ඉහත බාහිර අයදුම්කරුවන්ගේ සුදුසුකම්
2. අදාළ විෂය ක්ෂේත්‍රයේ වසර 03 ක කළමනාකරණ ශ්‍රේණියේ I ශ්‍රේණියේ (MM) සතුටුදායක සේවා පළපුරුද්ද තිබීම සහ එහි දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය සමත් වී තිබීම. (පශ්චාත් උපාධියක් ලබා තිබීම)

**වැටුප් පරිමාණය :** HM 1-2 - 2025 : රු. [143,120 - 15 X 4,100 - 204,620]

(කළමනාකරණ සේවා චක්‍රලේඛ : 01/2025 අනුව 2025/01/01 සිට රු. 107,105.00 , 2026/01/01 සිට රු. 125,113.00 සහ 2027/01/01 සිට රු. 143,120.00)

අනෙකුත් දීමනා :

- ප්‍රවාහන දීමනාව (රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ 01/2015 (i) අනුව)
- ඉන්ධන දීමනාව (රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ 01/2015 (ii) අනුව)
- වෘත්තීය දීමනාව (කළමනාකරණ සේව චක්‍රලේඛ 01/2025 අනුව)
- වෛද්‍ය රක්ෂණාවරණය

**වයස** : අවුරුදු 35 නොඅඩු හා අවුරුදු 55 ට නොවැඩි විය යුතුය.
අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.

**පත්වීම්** : මෙම පත්වීම් ස්ථිර පත්වීම් වේ.සේවක අර්ථ සාධක අරමුදලට හා සේවක භාරකාර අරමුදල සඳහා හිමිකම් ඇත.

**සියලුම අයදුම්කරුවන්**

- ශ්‍රී ලාංකික පුරවැසියකු විය යුතුය.
- තනතුරට අදාළ කාර්යයන් සිදු කිරීම සඳහා මානසික හා ශාරීරික වශයෙන් යෝග්‍ය විය යුතු අතර, දිවයිනේ ඕනෑම ස්ථානයක සේවය කිරීමේ හැකියාව පැවතිය යුතුය.
- යහපත් චරිත ස්වභාවයකින් යුක්ත විය යුතුය.

**අයදුම්කරුවන්,**

- ඥාති නොවන නිර්දේශකයන් දෙදෙනෙකුගේ නම් සහ ලිපිනයන් සහිතව සකස් කරන ලද ජීව දත්ත විස්තර සහිත අයදුම්පතක්, සියලුම අධ්‍යාපන සුදුසුකම්, වෘත්තීය සුදුසුකම්, සේවා පළපුරුද්ද සනාථ කිරීමේ පිටපත් සමග එවිය යුතුය. දැනටමත් රාජ්‍ය/ සංස්ථා/ ව්‍යවස්ථාපිත මණ්ඩල වල සේවයේ නියුතු නිලධාරීන් තම ආයතන ප්‍රධානියා මගින් අයදුම්පත එවිය යුතු වේ.
- අයදුම්කරනු ලබන තනතුර ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ සටහන් කළ යුතුය.
- **ප්‍රධාන විධායක නිලධාරී, ජාතික රක්ෂණ භාර අරමුදල, නො : 95, ශ්‍රීමත් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත, කොළඹ 02** යන ලිපිනයට **2025.11.24** දිනට පෙර ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු වේ. ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**ප්‍රධාන විධායක නිලධාරී,**
**ජාතික රක්ෂණ භාර අරමුදල,**
**නො, 95, ශ්‍රීමත් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත, කොළඹ 02.**